සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2018

10 ශ්‍රේණිය **ක්‍රිස්තියානි ධර්මය - I** කාලය පැය 01 යි.

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි ඃ

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්න වල දී ඇති 1, 2, 3, 4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

---

01. ජනතාව අදමිටුකමින් ගලවා නැවත දෙවියන් වහන්සේ වෙත ගෙන ඒමට ක්‍රියා කරනු ලැබුයේ,
(1) දිවැසිවරුන් ය. (2) රජවරුන් ය. (3) පූජකවරුන් ය. (4) පරිසිවරුන් ය.

02. අපට ළදරුවෙක් උපන්නේය. අපට පුත්‍රයෙකු දෙන ලද්දේය. . . . මෙසේ දිවැස්වැකි පැවසුයේ,
(1) මීකා දිවැසිවරයා ය. (2) මලාකි දිවැසිවරයා ය.
(3) යෙසායා දිවැසිවරයා ය. (4) ජෙරමියා දිවැසිවරයා ය.

03. සමිඳුන්ට පෙරටුව ගොස් ජනතාවට දේව රාජ්‍ය පිළිගැනීමට මඟ පිළියෙල කරන බව පැවසුයේ,
(1) ජේසුතුමා පිළිබඳව ය. (2) ස්නාවක ජොහන් පිළිබඳව ය.
(3) පේදුරුතුමා පිළිබඳව ය. (4) සෙකරියස් පිළිබඳව ය.

04. ජේසු උපත දනුම් දීමේ දී මරියතුමිගේ ප්‍රතිචාරයට මුල් වූ ප්‍රධාන ගුණාංගය වන්නේ,
(1) ප්‍රේමය ය. (2) පරිත්‍යාගය ය. (3) සහයෝගය ය. (4) නිහතමානිකමය ය.

05. ජේසුස් වහන්සේගේ ශ්‍රාවකත්වයට කැඳවීම ලබන්නෙකු තුළ මුල්විය යුතු ක්‍රියාකාරී ලක්ෂණ වන්නේ,
(1) ඉවසීම ය. (2) පරිත්‍යාගශීලීත්ව ය. (3) උත්සාහය ය. (4) යටහත් පහත් බවය.

06. කිතුණු පවුලක සාමාජිකයින්ට ගැටළු සහගත අවස්ථාවලදී කල යුත්තේ,
(1) පියාගේ විසඳුම් පිළිගැනීමය ය.
(2) වැඩිහිටියන්ගේ උපදෙස් පිළිගැනීමය ය.
(3) සියලු දෙනාම එක්ව සාකච්ඡාකර විසඳුමකට යෑමය.
(4) කාලයට ඉඩ දී විසඳුමක් ලැබෙනතුරු බලාසිටීම ය.

07. තමන්ගේ ධාර්මිෂ්ඨකම පිළිබඳ නිරතුරු උඩගු වුයේ,
(1) සද්දුසිවරුන් ය. (2) විනයධරයන් ය. (3) ලියන්නන් ය. (4) පරිසිවරුන් ය.

08. සබත පිළිබඳ ජේසුස් වහන්සේ ඉගැන් වුයේ,
(1) එය අන් අයගේ යහපතට යොදවන්න යනුවෙනි.
(2) එය ශුද්ධ පවත්වන්න යනුවෙනි.
(3) හැකි තරම් විවේකිව ගත කරන්න යනුවෙනි.
(4) දේවස්ථානයට ගොස් නමස්කාර කරන්න යනුවෙනි.

09. ක්‍රිස්තු උපත දිළිඳුන්ට සුභාරංචියක් වන බව ප්‍රකාශ වන්නේ,
(1) ජෝසෙප්තුමා වඩු කර්මාන්තයේ යෙදුනු බැවිනි.
(2) ජෙසුතුමා දිළින්දන් සමඟ ඇසුරු කළ බැවිනි.
(3) ජේසු උපත මුලින්ම දිළිඳු එඬේරුන්ට ප්‍රකාශ කළ බැවිනි.
(4) ජේසුස් වහන්සේ තැනින් තැන ගමන් කළ බැවිනි.

10. ජේසුස් වහන්සේ ළදරුවන් පිළිබඳ දැක් වූ ආකල්පය වුයේ,

(1) දෙවියන් වයහන්සේගේ රාජ්‍යය ලෙස ය. (2) ඔවුන් තම අත් උදව්කරුවන් ලෙස ය.

(3) ඔවුන් මෙහෙකරුවන් ලෙස ය. (4) සමාජයට උවමනා අය ලෙස ය.

11. දාවිත්ගේ නුවර උපන් ''ක්‍රිස්තුස් නම්'' ගැළවුම්කරුගේ ''සළකුණ'' ලෙස දෙව්දූතුන් එඬේරුන්ට සැලකළේ,

(1) රජ මැදුරක ඉපදී සිටින දරුවකු සම්බ වන්නේ යනුවෙනි.

(2) ගව ඔරුවක බාවා සිටින බිළිඳෙක් ඔබට සම්බ වන්නේ යනුවෙනි.

(3) ගව ගාලක ඉපදී සිටින දරුවකු ඔබට සම්බ වන්නේ යනුවෙනි.

(4) රෙදි වලින් ඔතා සිටින බිළිඳකු සම්බ වන්නේය යනුවෙනි.

12. ජේසුස් වහන්සේ තම සේවයට සුදානම් වූ අයුරු දැක්වෙන වරණය වන්නේ,

(1) කැපවීමෙන්, මමත්වයෙන්, යාච්ඤාවෙන් හා භාවනාවෙන් ය.

(2) වැයවීමෙන්, මමත්වයෙන්, කැපවීමෙන් හා යාච්ඤාවෙන් ය.

(3) වැයවීමෙන්, කැපවීමෙන්, යාච්ඤාවෙන් හා භාවනාවෙන් ය.

(4) කැපවීමෙන්, මොර ගැසීමෙන්, යාච්ඤාවෙන් හා භාවනාවෙන් ය.

13. ගලීලයේ නාසරෙත් නුවර විසූ ජොසෙප්තුමා සහ මරියතුමියට සංගණනයට ලියවීමට ජුදයේ බෙත්ලෙහෙමට යන්නට සිදු වුයේ,

(1) දාවිත්ගේ වජශයෙන් කිතු උපත සිදුවන බව කියාතිබු නිසා ය.

(2) දරුවා ලැබීමට බෙත්ලෙම වඩා සුදුසු නිසා ය.

(3) දාවිත්ගේ රාජ පෙළපත වඩා උතුම් වූ නිසා ය.

(4) දාවිත්ගේ වංශයට හා පෙළපතට අයත් වු නිසා ය.

14. ස්වාමින් වහන්සේ වෙත ජනතාව හරවමින් ඔවුන්ට මනස්ථාපනයේ බෞතිස්මය ලබා දෙනු ලැබුයේ,

(1) ස්නාවක ජොහන්තුමා ය. (2) ජේසුස් වහන්සේ ය.

(3) දෙවියන් වහන්සේ ය. (4) ආබ්‍රහම් තුමා ය.

15. පාපය මිස පව්කරුවන් ප්‍රතික්ෂේප කිරීම ............... පිළිවෙත නොවීය. මෙහි හිස්තැනට සුදුසු වන පිළිතුර වන්නේ,

(1) ස්නාවක ජොහන්ගේ (2) සීමොන් පේදුරුගේ

(3) දෙවියන් වහන්සේගේ (4) ජේසුස් වහන්සේගේ

16. අඳනා දෙකක් ඇති අය නැති අයට දෙත්වා ....... යනුවෙන් ස්නාවක ජොහන් දේශනා කළේ කාහට ද?

(1) ආරක්ෂක අංශයේ අයට යි. (2) රාජ්‍ය සේවයේ අයට ය.

(3) පොදු ජනතාවටය ය. (4) ජුදා ආගමික ජනතාවටය ය.

17. රෝම අධිරාජ්‍ය වෙනුවෙන් බදු අයකල ජුදෙව් අයකැමියන් ජුදා ජනතාව විසින් සලකනු ලැබුයේ,

(1) දේශ දෝහින් හා පව් කරුවන් ලෙස ය. (2) සහනදායකයින් හා සුබ පතන්නන් ලෙස ය.

(3) සමාජ විරෝදීන් හා අපවිත්‍ර වුවන් ලෙස ය. (4) ප්‍රභුවරුන් හා පුජකයින් ලෙස ය.

18. උතුරේ සිටි ජුදෙව්වන් විසින් උතුරේ සිටි සාමාරිතයන් ලෙස හැඳින් වූ තම සහෝදර ජනතාව ප්‍රතික්ෂේප කළේ ඔවුන්,

(1) වෙනත් දෙවිවරු නමස්කාර කළ නිසා ය. (2) ජුදෙව් ව්‍යවස්ථාව කඩ කළ නිසා ය.

(3) අන්‍ය ජාතින් සමඟ මිශ්‍ර වීම නිසා ය. (4) රෝම අධිරාජ්‍යයට සේවය කල නිසා ය.

19. නායක පුජක තනතුර තම පවුල් වලට ලබා ගැනීමට කටයුතු කල ජන කණ්ඩායම වන්නේ,

(1) පරිසිවරුන් ය. (2) සද්දුසිවරුන් ය. (3) එසීනවරුන් ය. (4) රෝමවරුන් ය.

20. දේව මාළිගාව පවිත්‍ර කිරීමෙන් අනතුරුව සද්දුසිවරුන් ජේසුස් වහන්සේගෙන් ඇසූ ප්‍රශ්නය වූයේ,

    (1) ඔබ මේ දේ කරන්නේ කුමන අයිතියකට ද යනුවෙන් ය.

    (2) ඔබට මේ දේ කරන්න කීවේ කවුරුන්ද යනුවෙන් ය.

    (3) ඔබ මෙහෙම කරන්නේ ඇයි ද යනුවෙන් ය.

    (4) ඔබ මේ දෙවල් කරන්නේ කුමන අධිකාරි බලයකින් ද යනුවෙන් ය.

21. සීසර්ගේ දේ සීසර්ටත් දෙවියන් වහන්සේගේ දේ දෙවියන් වහන්සේටත් දෙන්නැයි ජේසුස් වහන්සේ පිළිතුරු දීමට සද්දුසිවරු ඇසූ ප්‍රශ්නය වූයේ,

    (1) බදු ගෙවීම යුත්තේ කාට ද කියා ය. (2) බදු ගෙවිය යුත්තේ කෙසේ ද කියා ය.

    (3) සීසර් අධිරාජ්‍යයාට බදු ගෙවිය යුතු ද කියා ය. (4) දේව මාළිගාවට බදු ගෙවිය යුතුද කියා ය.

22. ජේසුස් වහන්සේ රාජ තේජසින් ජෙරුසලම් ගමන සඳහා කොටළුවකු තෝරා ගැනීමෙන් සංකේතවත් වන්නේ,

    (1) අහිංසකත්වය යි. (2) රණකාමීත්වය යි. (3) දුබලකම යි. (4) මුරණ්ඩුකම යි.

23. පාස්කු මංගල්‍යය පදනම් කර ගනිමින් ජේසුස් වහන්සේ ඉටුකළ කාර්යය වන්නේ,

    (1) මළවුන් උත්ථාන කිරීමයි. (2) රොටි කැඩීමයි.

    (3) පාද සේදීමයි. (4) රෝගීන් සුව කිරීමයි.

24. ''ජේසුස් වහන්සේ ගෙත්සෙමන යාච්ඤාවේදී මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේවායැයි'' පැවසීමෙන් උන්වහන්සේ අපට උගන්වන්නේ,

    (1) කුරුස පූජාවට අකමැති වූ බවයි. (2) දේව උදහසට ලක්වීමට අකමැති බවයි.

    (3) දේව බලකිරීමට අවනත වූ බවයි. (4) තමකම සම්පූර්ණයෙන්ම නසා දැමූ බවයි.

25. අපගේ ජීවිත වලට පැමිණෙන අභියෝග ඉදිරියේ යාච්ඤාව අදාළ කර ගැනීමට මඟ පෙන්වන ජේසුස් වහන්සේගේ ප්‍රකාශය වන්නේ,

    (1) නැගිට සහෝදරයින් ධෛර්යමත් කරන්න යනුයි.

    (2) පරීක්ෂාවට නොවැටෙන පිණිස නැගිට යාච්ඤා කරන්න යනුයි.

    (3) මාගේ රැළ පෝෂණය කරන්න යනුයි.

    (4) දිනපතා යාච්ඤාවෙන් ගත කරන්න යනුයි.

26. පවා දීමෙන් පසු ජේසුස් වහන්සේ අල්ලාගත් මුර සෙබලුන් උන්වහන්සේ රැගෙන ගියේ,

    (1) උත්තම පූජකයාගේ මැඳුරට ය. (2) රෝම අධිරාජයයා ළඟට ය.

    (3) පිලාත් ආණ්ඩුකාරයා ළඟට ය. (4) හෙරොද් රජතුමා ළඟට ය.

27. ජේසුස් වහන්සේ විනිශ්චය කරනු පිණිස පිලාත් විසින් හෙරොද් වෙත යවනු ලැබුයේ,

    (1) හෙරොද් ඉහළ තනතුරක් දැරූ නිසාය. (2) පිලාත් බියට පත් වූ නිසාය.

    (3) උන්වහන්සේගේ නිර්දෝශී බව දුටු නිසාය. (4) ජනතාවගේ දැඩි ඉල්ලීම නිසාය.

28. පේදුරුතුමා ජේසුස් වහන්සේ පිළිබඳ මනා අවබෝධයක් ඇති කර ගෙන තිබූ බවට සාක්ෂියක් වන ප්‍රකාශය වන්නේ,

    (1) ස්වාමීන් මා වෙතින් අහක් වූව මැනව යනුයි.

    (2) ස්වාමීනි මා ගලවා ගන මැනව යනුයි.

    (3) ස්වාමීනි අපට පිහිට වූව මැනව යනුයි.

    (4) ඔබ දෙවියන් වහන්සේගේ ක්‍රිස්තුවරයාණෝය යනුයි.

29. ජීවිතයේ අවසන් මොහොතේ හෝ තම වැරැදි ගැන පසුතැවිලි වී කමාව ලැබීම තුළ ගැලවීම ලද හැකි බව උගන්වන්නේ,

    (1) අකීකරු පුත්‍රයාගේ කථාවෙනි.

    (2) කුරුසියේ පසුතැවිලි වූ වරදකරුවාගෙනි.

    (3) පේදුරුගේ පසුතැවිලි වීමේ සිද්ධියෙනි.

    (4) කීරේනියේ සීමොන් කුරුසිය උසුලාගෙන යාමෙනි.

30. අරමාතියේ ජෝසෙප් ජේසුස් වහන්සේගේ මෘත දේහය පිලාත්ගෙන් ඉල්ලීමෙන් කිතුණු අපට දෙන ආදර්ශය වන්නේ,

(1) පිලාත්ගේ තීන්දුවට අභියෝග කිරීමයි. (2) ජුදෙව්වන්ගේ ක්‍රියාකලාපය අනුමත කිරීමයි.

(3) සත්‍යයට සාක්ෂි දැරීමයි. (4) ජුදෙව් මන්ත්‍රණ සභාවට අභියෝග කිරීමයි.

31. එම්මාවුස් ගමට ගිය ශ්‍රාවකයින් දෙදෙනා ජේසුස් වහන්සේගේ උත්ථානය පිළිබඳ තම අත් දැකීම අනෙක් ශ්‍රාවකයින් සමඟ බෙදා ගනු ලැබුයේ,

(1) ස්වාමීන් වහන්සේ අපට මුණ ගැසුනා යනුවෙන් පැවසීමෙනි.

(2) ස්වාමීන් වහන්සේ අප සමඟ නවාතැන් ගත්සේක යනුවෙන් පැවසීමෙනි.

(3) සමිඳාණන් වහන්සේ අප සමග ගමන් ගත්සේක යනුවෙන් පැවසීමෙනි.

(4) ඒකාන්තයෙන්ම සමිඳාණන් වහන්සේ නැගිට සිටිනසේකැයි පැවසීමෙනි.

32. බෞතිස්මයේදී අපට දායාද වන දේව වරප්‍රසාදයක් වන්නේ,

(1) ශුද්ධාත්මය යි. (2) කිතුණුකම යි. (3) පාපකමාව යි. (4) දේව දරුකම යි.

33. සියලු කටයුතු වලදී දෙවියන් වහන්සේට මුල්තැන දීමටත් දේවගරු බිය පාමින් ජීවත් වීමටත් කිතුණු අපට මඟ පෙන්වන්නේ ජේසුස් වහන්සේට පැමිණි කීවෙනි පරීක්ෂාවට දුන් පිළිතුරෙන්ද?

(1) පළමු පරීක්ෂාවට ය. (2) දෙවනි පරීක්ෂාවට ය.

(3) තුන්වන පරීක්ෂාවට ය. (4) ඉහත සියල්ලටම ය.

34. ජේසුස් වහන්සේ මුහුණ දුන් තුන්වන පරීක්ෂාවට සමාන අභියෝගයකට නැවත මුහුණ දෙන්නේ,

(1) ආශභාග රෝගියා සුවකිරීමේදී ය. (2) ලාදුරු රෝගීන් දස දෙනා සුව කිරීමේදී ය.

(3) ජුදස්ගේ පාවාදීම අවස්ථාවේදී ය. (4) කුරුසියේ පළමු සොරාගේ ප්‍රකාශයේදී ය.

35. ජේසුස් වහන්සේගේ උත්ථානය හා ස්වර්ගාරෝහණයෙන් පසු ශ්‍රාවකයින්ගේ සාක්ෂි දැරීමේ පදනම වූයේ උන්වහන්සේගේ,

(1) බෞතිස්මය යි. (2) රූප විපර්යාසය යි. (3) කුරුසිපත් වීම යි. (4) උත්ථානය යි.

36. කිතුණු අපගේ ජීවිත ආලෝකමත් වීමට නම් අප,

(1) ජීවමාන ජේසුස් වහන්සේ පිළිබඳ නිවරැදි දැක්මක් තිබිය යුතුය.

(2) කිතුනුවන් බව අන් අයට ප්‍රකාශ කළ යුතුය.

(3) සෑම ඉරු දිනකම දේවස්ථානයට යා යුතුය.

(4) සෑම දිනකම බයිබලය කියවිය යුතුය.

37. බඩගින්න, පිපාසය, දුක, සතුට, වේදනාව ජේසුස් වහන්සේට දැනුනේ මන්ද?

(1) සැබෑ මනුෂ්‍යයකු ලෙස ජීවත් වූ නිසාය. (2) දෙවියන් වහන්සේගේ කරුණාව ලැබූ නිසාය.

(3) සෑම විටම සිත් වේදනාවෙන් සිටි නිසාය. (4) නතිවම වාසය කිරීම නිසාය.

38. අන්වෙසක් වීමේදී ජේසුස් වහන්සේ දෙපසින් දර්ශනය වූයේ,

(1) එළියා සහ පේදුරු ය. (2) පේදුරු සහ ජොකොබ් ය.

(3) මෝසෙස් සහ එළියා ය. (4) මෝසෙස් සහ ජාකොබ් ය.

39. ශු බයිබලයට අනුව වළාපටලය නිතර සංකේතවත් කරනු ලැබුයේ,

(1) දේව ස්වභාවය යි. (2) ශුද්ධාත්ම ආලෝකය යි.

(3) ශුද්ධාත්මයාණන්ගේ හඬයි. (4) දේව අභිමුඛත්වය යි.

40. කිතුණු දරුවකු වන ඔබ පංතියේ අසරණ දරුවකු දැක්විය යුතු ප්‍රතිචාරය වන්නේ,

(1) හැකි සෑම විටම උදව් උපකාර කිරීම ය. (2) ඔහුට විහිළු තහළු කිරීම ය.

(3) ඔහුට අඩුපාඩු ඇති බව අන්අයට කීමට ය. (4) ඔහුව අතේ දුරින් ආශ්‍රය කිරීම ය.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# දෙවන වාර පරීක්ෂණය 2018
# ක්‍රිස්තියානි ධර්මය - II

**10 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකය: |
|---|

- **පළමුවන ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

(01) (1) සණුදුරේ කල් යැව් සෙනග මහත් එළියක් දුටුහ. මෙහි ඉරිඇඳි පදවලින් අදහස් කරන්නේ කුමක්ද?

(2) (අ) පැමිණෙන්නට සිටින තැනැන්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය පිළිබඳ පැහැදිලි කල දිවැසිවරයා කවුරුන්ද?

(ආ) ඔහු එය ඉදිරිපත් කර ඇත්තේ කෙසේද?

(3) ස්නාවක ජොහන්තුමා තම අනුගාමිකයින්ට ජේසුස් වහන්සේ හඳුන්වා දුන්නේ කෙසේද?

(4) කිතුණු ආගමට ආවේණික වත් පිළිවෙත් 2 ක් ලියන්න.

(5) සාකෙවුස්ගේ ජීවිතයේ කැපී පෙනුන සිද්ධීන් 2 ක් ලියා දක්වන්න.

(6) ''ඔබ දෙවියන් වහන්සේගේ ක්‍රිස්තුවයාණෝමය'' මෙසේ පැවසුවෙ කවුරුන් විසින් කවුරුන් පිළිබඳවද?

(7) සබත් දිනයේදී ජේසුස් වහන්සේගෙන් සුවය ලැබු රෝගීන් දෙදෙනා කවුරුන්දැයි සඳහන් කරන්න.

(8) පරිසිවරු සහ සද්දුසිවරු අතර පැවති ආගමික මතවාද 2 ක් ලියා දක්වන්න.

(9) (අ) ජුදෙව් ආගමික නීතිය අනුව චෝදනා විභාග කර තීන්දුව දුන් ආයතනය කුමක්ද?

(ආ) එහි නායකත්වය දැරුවේ කවුරුන්ද?

(10) කිතුණු දරුවකු ලෙස ඔබ පන්ති කාමරයේ දී ඉටුකරන කාර්යයන් 2 ක් ලියන්න.

(ල. 20)

(02) (1) ස්නාවක ජොහාන්ගේ මව සහ පියා කවුරුන්ද?

(2) ක්‍රිස්තු උපත පිළබඳ ප්‍රකාශිත අනාවැකි 3 ක් ලියා දක්වන්න.

(3) සෙකරියස් පුජකතුමා ළඟ තිබුනාවු ගුණාංග 5 ක් පෙන්වා දෙන්න. (ල. 2 + 3 + 5 =10)

(03) (1) ''දියඹට ගොස් දැල් හෙලන්න'' යනුවෙන් පැවසුයේ කවුරුන්ද? කුමන ස්ථානයකදීද?

(2) ධර්මදූත චාරිකා වලදී වල ප්‍රතිඵල 3 ක් පෙන්වා දෙන්න.

(3) වත්මන් සමාජයේ ධර්මදූත සේවය සඳහා ඔබට කැඳවීමක් ලැබුනොත් ඔබ ක්‍රියා කරන්නේ කෙසේදැයි කරුණු පහකින් විස්තර කරන්න. (ල. 2 + 3 + 5 =10)

(04) (1) ලෙවී කැඳවීමේදී පරිසවරුන් ජේසුස් වහන්සේට ඉදිරපත් කළ ප්‍රශ්නය කුමක්ද?

(2) එම ප්‍රශ්නයට ජේසුස් වහන්සේ දුන් පිළිතුර ලියා දක්වන්න.

(3) බහුවිධ සමාජයක ජීවත් වන කිතුණු දරුවකු වන ඔබට මුහුණ දීමට සිදු වූ අභියෝගයක් සඳහන් කර එයට කමුහුණ දුන් ආකාරය පැහැදිලි කරන්න. (ල. 2 + 3 + 5 =10)

(05) (1) ''ස්වාමිනි ඔබ සමඟ හිරේ යාමට හා මරණයට වුවද මම සුදානම්ව සිටිමි. මෙසේ කීවේ කවුරුන්ද? කාටද?

(2) ''එහෙත් නුඹේ ඇදහිල්ල නොබිදෙන පිණිස ඔබ උදෙසා මම යාච්ඤා කළේමි.'' මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

(3) කිතුණු දරුවකු වන ඔබගේ ඇදහිල්ල බිඳී ගිය අවස්ථා 2 ක් සඳහන් කර එම අවස්ථාවන් වල ඔබ ක්‍රියාකල අයුරු කෙටියෙන් පැහැදිලි කරන්න.

(ල. 2 + 3 + 5 =10)

(06) (1) ''ජීවමාන තැනැත්වහන්සේ මළවුන් අතර සොයන්නේ මන්ද? මෙසේ ඇසුවේ කවුරුන්ද? කාගෙන්ද?

(2) ඉහත අවස්ථාව කෙටියෙන් විස්තර කරන්න.

(3) ක්‍රිස්තුස් වහන්සේගේ ජීවමාන වැඩ සිටීම ඔබගේ ජීවිතයේ අත්දැකීමක් ඇසුරින් විස්තර කරන්න.

(ල. 2 + 3 + 5 =10)

(07) පහත මාතෘකා අතුරින් දෙකක් පමණක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(1) මනස්ථාපනය

(2) රූප විපර්යාසය

(3) පෙරමඟ දූත සේවය

(4) අරමානියේ යෝසප් (ල. 2 + 3 + 5 =10)

**පිළිතුරු පත්‍රය - I කොටස**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(1) | 2 -(3) | 3 -(2) | 4 -(4) | 5 -(4) | 6 -(3) | 7 -(4) | 8 -(1) | 9 -(3) | 10-(1) |
| 11-(2) | 12-(3) | 13-(4) | 14-(1) | 15-(4) | 16-(3) | 17-(1) | 18-(3) | 19-(2) | 20-(4) |
| 21-(3) | 22-(1) | 23-(2) | 24-(4) | 25-(2) | 26-(1) | 27-(2) | 28-(4) | 29-(2) | 30-(3) |
| 31-(4) | 32-(1) | 33-(2) | 34-(4) | 35-(2) | 36-(1) | 37-(1) | 38-(3) | 39-(4) | 40-(1) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

**II කොටස**

(01) (1) සනදුරේ - පාපයේ නියැලී සිටි

එළියක් දුටුහ - ජේසුස් වහන්සේ තුළින් ජීවිත වලට ආලෝකයක් ලබා ගැනීම

(2) (අ) යෙසායා දිවැසිවරයා

(ආ) ප්‍රකාශය - එතුමාගේ යුක්තියෙන් ද ධර්මිෂ්ඨකමින්ද රජකම් කරන සේක. යෙසායා 9 : 7

(3) ''ලෝකයේ පව්දුකරන දෙවියන්ගේ බැටළු පෝතකයාණෝ ලෙසය''

(4) බෞතිස්මය, කැප කිරීම, ශුද්ධ සහභාගිකම

(5) • ජේසුස් වහන්සේ සංකෙවුස්ව පිළිගැනීම

• ජේසුස් වහන්සේ දැක බලා ගැනීමට තිබු ආශාව ඉටුවීම.

(6) පේදුරු විසින් ජේසුස් වහන්සේ පිළිබඳවය.

(7) දිය උදර රෝගියා සහ අත පණ නැති මිනිසා

(8) • පරිසිවරු වාචික සම්ප්‍රදායේ නීති පිළිගත් අතර සද්දුසිවරු ලිඛිත ව්‍යවස්ථාව පමණක් පිළිගත්තාය.

• පරිසිවරු දේව දූතයන් හා ප්‍රනර්ජීවනය පිළිගත් අතර සද්දුසිවරු එය පිළි නොගත්තාය.

(9) (අ) ශ්‍රේෂ්ඨාධිකරණය (ආ) උත්තම පූජකයා

(10) • යහළුවන් දන්නේ නැති දෙයක් කියා දීම. • මා ළඟ ඇති දේවල් බෙදා ගැනීම

වැනි ලියා ඇති පිළිතුරු අනුව ලකුණු දෙන්න.

(02) (1) සෙකරියස් පූජකතුමා, එළිසැබෙත්

(2) • උන්වහන්සේ ශ්‍රේෂ්ඨ වන සේක.

• පරමෝත්තමයාණන්ගේ පුත්‍රයාණෝ යැයි කියනු ලබන සේක..

• උන් වහන්සේගේ පිය වූ දාවිත්ගේ සිංහාසනය දෙවි ස්වාමින් වහන්සේ උන් වහන්සේට ප්‍රදානය කරන සේක.

• උන් වහන්සේ ජාකොබ්ගේ වංශය කෙරෙහි සටහටම රජකම් කරන සේක.

• උන් වහන්සේගේ රාජ්‍ය කෙලවරක් නො දන්නේය. මින් කරුණු 3 ක් ලියා තිබීම

(3) • දැහැමි බවින් යුක්ත වීම. • දේව අණ පනත් නිසි ලෙස ඉටු කිරීම

• දෙවියන් වහන්සේට ගරුබිය දැක්වීම • නිරන්තරයෙන් දේව කන්නලව්වේ නිරත වීම.

• දෙවියන් වහන්සේ කෙරෙහි අචල විශ්වාසයෙන් සිටීම.

(03) (1) ජේසුස් වහන්සේ - ගෙනසරත් විල අසලදී (ගලීල මුහුද, හිබේරියස් මුහුද)

(2) • රට පුරා සුබ අස්න ප්‍රකාශ වීම.

• දුෂ්ඨ ආත්ම දුරුවීම

• දෙවියන් වහන්සේගේ නාමය තුළ රෝගීන් සුවය ලැබීම.

**පිළිතුරු පත්‍රය - II කොටස - ඉතිරි කොටස**

(3) • සමාජයේ නොපිළිගන්නන් උදෙසා පිළි ගැනීමට යොමු කිරීම..
- හැකි සෑම විටම සේවයේ යෙදීම.
- අවශ්‍ය සෑම විටම දේව වචනය පහදා දීම.
- යාච්ඤා ජීවිතයේ වැදගත්කම පෙන්වා දීම.
- භේදයකින් තොරව ජීවිත නගා සිටුවීමට ක්‍රියා කිරීම.

වැනි ලියා ඇති පිළිතුරු අනුව ලකුණු දෙන්න.

(04) (1) ඔබ අයකැමියන්ද පව්කාරයන්ද සමඟ කනනෙත් බොන්නෙත් මන්දයි ඇසීම.
(2) ''රෝගීන්ට මිස නීරෝගීන්ට වෙදාගෙන් වැඩක් නැත. මා අපේ පව්ටුන් මිස දමිටුන් පසුතැවී සිත් හරවා ගැනීමට කැඳවීම පිණිස නොවේ.'' යනුවෙනි.
(3) සිසුන් තම අත්දැකීමක් අනුව ලියා ඇති කරුණු සලකා ලකුණු ලබා දෙන්න.

(05) (1) පේදුරුතුමන් විසින් ජේසුස් වහන්සේට
(2) ප්‍රේරිතයන් කොතරම් උන් වහන්සේ සමඟ සිටියත් ඔවුන් උන්වහන්සේ අතහැර යන බව උන් වහන්සේ දැන සිටි බවත්, ඔවුන් වෙනුවෙන් උන් වහන්සේ යාච්ඤා කළ බවත්ය.
(3) සිසුන් තම අත්දැකීම් විස්තර කර ඇති පිළිවෙලට ලකුණු ලබා දෙන්න.

(06) (1) දේව දූතයන් විසින් ජේසුස් වහන්සේගේ සොහොන වෙත පැමිණි ස්ත්‍රීන්ට.
(2) ජුදෙව් චාරිත්‍රයක් ලෙස ජේසුස් වහන්සේගේ මෘත දේහය සුවඳ ද්‍රවය ආලේප කිරීම සඳහා එම ද්‍රව්‍ය රැගෙන කාන්තාවන් ජේසුස් වහන්සේ තැන්පකත් කළ සොහොන් ගෙය වෙත පැමිණෙන විට එහි සිටි දේවදූතයන් ඔවුන්ට මෙසේ පවසන ලදී.
(3) සිසුන් ලියා ඇති තම අත්දැකීමක් ඇසුරින් කරුණු වලට ලකුණු ලබා දෙන්න.

(07) (1) මනස්ථාපනය

මනස්ථාපනය යනු තම වැරදි තේරුම් අරගෙන නැවත ඒවා නොකරන්න වගබලා ගැනීමයි. සිතාවක ජොහන්තුමා මෙම මනස්ථාපනයේ බෞතිස්මය ජුදා ජන කොටසට පමණක් සීමා නොකරමින් සියලුම ජන කොටස් වලට ජෝර්දාන් ගඟෙන් බෞතිස්මය ලබා ගැනීමට අවස්ථාව ලබා දෙන ලදී. ස්නාවක ජොහන්තුමා රටේ සෑම අංශයක ජනතාවට අනුශාසනා කරමින් මනස්ථාපනයේ බෞතිස්මය දීම තුළින් රටේ යහපත් පැවැත්මට එක්වීමට ආරාධනා කළේය.

(2) රූප විපර්යාසය

ජේසුස් වහන්සේගේ ජීවිතයේ ඉතා වැදගත් සිද්ධියකි. සත්‍යතාවයේ ආලෝකයාණන් අනාවරණය වූ අවස්ථාවකි. ප්‍රථම ශ්‍රාවකයන් තිදෙනා දර්ශනය කල ජීවමාන අත්දැකීමකි. ජේසුස් වහන්සේ උත්ථානය හා ස්වර්ගාරෝහණයෙන් පසු ශ්‍රාවකයන්ගේ සාක්ෂි දැරීමේ පදනම වූයේ මෙම අත්දැකීමය. ජේසුස් වහන්සේ කන්දකට නැඟ යාච්ඤාකරන අවස්ථාවේදී උන් වහන්සේගේ මුහුණ වෙනස් වී ධවල කාන්තියෙන් බැබලිණි. උන් වහන්සේ දෙපස මෝසෙස් සහ එළියා තේජශ්‍රීයෙන් වැඩ සිටිම මෝසෙස් මගින් ව්‍යවස්ථාව සම්පූර්ණ වීම එළියා මගින් දිවැසිවලියාව සම්පූර්ණ වීම සංකේතවත් කරයි.

(3) පෙරමඟ දූත සේවය

පෙරමඟ දූතයා ලෙස ස්නාවක ජොහන් හඳුන්වයි. රෝම අධිරාජ්‍යයට යටත්ව තිබූ ප්‍රදේශ වන ජුදය, ගලීලය, ඉතුරය, ත්‍රිකෝනිය සහ අබිලේනය යන ප්‍රදේශ වල ජීවත් වූ ජනතාව වෙත මූලික ලෙස ස්නාවක ජොහන්තුමාගේ පණිවිඩය යොමුවිණි. ස්නාවක ජොහන්තුමාගේ මූලික පරමාර්ථය වූයේ ජේසුස් වහන්සේ මෙසියස් වහන්සේ ලෙසට පිළිගැනීමට අවශය කරන පසුබිම සකස් කිරීමයි. ඒ සඳහා මිනිස් ජීවිත වෙනසක් කරා යොමු කිරීමයි. ඒ සඳහා පොදු ජනතාවට, රාජ්‍ය අංශයේ යෙදි සිටි අයට, ආරක්ෂක අංශයට හා ජුදා ආගමික ජනතාවට අනුශාසනා කරමින් අබියෝග ඉදිරිපත් කලේය.

(4) අරමානියේ ජෝසෙප්

ජුදෙව් නවරක් වූ අරමානියෙන් පැමිණි ජෝසෙප් නම් මනුෂ්‍යයෙකි. උන් වහන්සේගේ මෘත දේහය පිලාත්ගෙන් ඉල්ලීමට තරම් එඩිතර විය. උන් වහන්සේගේ මෘත දේහය හණ රෙදි වලින් වෙලා කිසිවකු නොතැබූ කණින ලද සොහොනක තැන්පත් කිරීමට බාර ගැනීමට ඉදිරිපත් විය. අරමානියෝ ජෝසෙප් ජුදා මන්ත්‍රණ සභාවේ සාමාජිකයකුව සිටිමින් වුවද ජුදෙව්වන්ගේ ක්‍රියා කලාපය අනුමත නොකල පුද්ගලයකු ලෙස මොහු අගය කළ හැකිය. ජෝසෙප් වහන්සේගේ ශ්‍රාවකයන් පවා උන් වහන්සේ නොහඳුනන බව ප්‍රකාශ කරද්දී දේශපාලන සිරකරුවකු ලෙස කුරුසිපත් කල ජේසුස් වහන්සේගේ මෘත දේහ ගෞරවාන්විතව සොහොනේ තැන්පත් කිරීමට ඉල්ලීමට තරම් ඔහු එඩිතර විය. ජේසුස් වහන්සේගේ අනුගාමිකයකු ලෙස ප්‍රසිද්ධියේ පෙනී සිටීමෙන් මොහු සත්‍යයට සාක්ෂි දැරීය.